# සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය රුවන්වැල්ල

## පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

සීමාසහිත රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා සමිති බල ප්‍රදේශයේ ප්‍රමුඛතා අනුපිළිවෙළට, කෑගල්ල දිස්ත්‍රික්කයේ වසර දෙකක ස්ථිර පදිංචි, වයස අවුරුදු 18 ත් -45 ත් අතර (සමුපකාර සමිතිවල දැනට සේවය කරන අයට වයස් සීමාව බලපානු නොලැබේ.) අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2021-11-15 දින දක්වා කැඳවනු ලැබේ. (ලිපිනය පහත සඳහන් කර ඇත)

**01. තනතුර** : **ලිපිකරු (මෙහෙයුම් II ශ්‍රේණිය)**

**වැටුප් ක්‍රමය** : රු. 19,500.00 - 10X110-10X120-21,800.00

(අනුමත දීමනා ද හිමි වේ)

**පන්තිය** : III

**පුරප්පාඩු සංඛ්‍යාව** : 02

**සුදුසුකම් :**

I. අ.පො.ස. (උ.පෙළ) සාමාර්ථය ලබා තිබීම

හෝ

II. ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ කළමනාකරණය පිළිබඳ ජාතික (උ.පෙළ) සහතිකය ලබා තිබීම

හෝ

III. සමුපකාර සාමාන්‍ය පෙළ සමත්වීම සමග පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක වසර 03 පළපුරුද්ද තිබීම

හෝ

IV. ගණිතය, සිංහල/ දෙමළ ඇතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සා.පෙළ) එකවර සමත්වීම සහ පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසර 03 ක පළපුරුද්ද ලබා තිබීම. (ඉංග්‍රීසි සමත් වීම අමතර සුදුසුකමක් සේ සැලකේ.)

හෝ

V. කාර්යාල කාර්ය සහායක තනතුරක වසර 05 ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**02. තනතුර** : **ශාඛා කළමනාකරු (මෙහෙයුම් II ශ්‍රේණිය)**

**වැටුප් ක්‍රමය** : රු. 19,500.00 - 10X110-10X120-21,800.00

(අනුමත දීමනා ද හිමි වේ)

**පන්තිය** : III

**පුරප්පාඩු සංඛ්‍යාව** : 01

**සුදුසුකම් :**

I. සිංහල හෝ දෙමළ ඇතුළුව සම්මාන 03 ක් සහ ගණිතය සමග විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම

හෝ

II. සමුපකාර මණ්ඩලය මගින් පිරිනමන සමුපකාර සාමාන්‍ය පෙළ සහතිකය ලබා තිබීම

හෝ

III. පිළිගත් වාණිජ/ කාර්මික ආයතනයක වෙළඳ සහායක තනතුරක වසර 05 පළපුරුද්ද තිබීම.

**03. තනතුර** : **වෙළඳ සේවක (සහාය සේවා II ශ්‍රේණිය)**

**වැටුප් ක්‍රමය** : රු. 16,500.00 - 10X80-05X90-17,750.00

(අනුමත දීමනා ද හිමි වේ)

**පන්තිය** : II

**පුරප්පාඩු සංඛ්‍යාව** : 01

**සුදුසුකම් :**

I. අ.පො.ස. (සා.පෙළ) ගණිතය හා සිංහල/ දෙමළ ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කින් සමත් වීම හා අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසරක පළපුරුද්ද තිබීම. (ගණිතයට සම්මාන තිබීම අවශ්‍ය නොවේ)

තමන් විසින් පිළියෙළ කරන ලද අයදුම්පත්, උප්පැන්න සහතිකය, අධ්‍යාපන සහතික, ග්‍රාම සේවා සහතිකය, චරිත සහතික දෙකක්, හැඳුනුම්පත, පළපුරුද්ද පිළිබඳ සහතික, සේවා සහතික හා වෙනත් සුදුසුකම් සහතිකවල ඡායා පිටපත් සමග පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කර එවිය යුතුය.

**"ගරු සභාපති, සී/ස රුවන්වැල්ල විවිධ සේවා සමුපකාර සමිතිය, රුවන්වැල්ල."**

**ගරු සභාපති,**
**සී/ස රුවන්වැල්ල වි.සේ.ස. සමිතිය, රුවන්වැල්ල.**
**2021-10-18**